**පශ්චාත් අර්බුද සමයේ පීඩාවෙන් අත්මිදෙන අවදිය: කතකගේ කතාවත**

# ශ්‍රී ලාංකික කාන්තාවගේ රැකවරණය

වයාපෘති හැඳින්වීම

'පශ්චාත් අර්බුද සමයේ පීඩාවෙන් අත්මිදෙන අවදිය : කතකගේ කතාවත නමැති ව්‍යාපෘතිය ජාතික සාම මණ්ඩලය විසින් ෆෝකුස් ආයතනයේ සහය ඇතිව ක්‍රියාත්මක කල ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය මඟින් කාන්තාවන්ට ප්‍රතිසංවිධාන ක්‍රියාවලියට සහභාගිවීම සඳහා පැවති අවහිරතා මඟහරවා ප්‍රජා මට්ටමේ ව්‍යාය-ාමයක් ලෙස පීඩාවෙන් අත්මිදීමේ අවකාශය නිර්මාණය කිරීම සිදුකෙරිණි. නිපුනතා සංවර්ධනය, ප්‍රාදේශීය සහ බිම්මට්ටමේ කාන්තා සහභාගීත්වය දිරිමත් කිරීම, පීඩාවෙන් අත්මිදවීමේ ක්‍රියාකාරකම් සිදුකිරීම සහ කා-න්තාවන්ගේ හඬට නිසි අවකාශයක් සැපයීමේ අවස්ථා නිර්මාණය කිරීම මෙම ව්‍යාපෘතියට ඇතුළත් වූ ප්‍රධාන අංශ කිහිපයකි. වර්ෂ 2014 සහ 2016 අතර කාලය තුළ දිස්ත්‍රික්ක 9ක ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතිය, පුත්තලම, මන්නාරම, වවුනියාව, ත්‍රිකුණාමලය, අම්පාර, හම්බන්ෙ-තාට, ගාල්ල, මහනුවර සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක පදනම් කොටගෙන ක්‍රියාත්මක විය.

කාන්තාවන්ගේ රැකවරණය පිළිබඳ මෙම සම්පිණ්ඩිත පත්‍රිකාව මඟින්, අදාළ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වූ අදහස් විමසීමේ සාකච්ඡා මාලාවේ ද මහා පරිමාණ ගැටලු සඳහා මෙන්ම නීති හා ප්‍රතිපත්ති පිළිබඳ කා-න්තාවන් හට පැවති ගැටලු හා ඒ පිළිබඳ ඔවුන්ගෙන් ම ලබාගත් නිර්දේශ ඒකා-බද්ධකොට ඉදිරිපත් කෙරේ. මෙහි දී අනාවරණය වූ කරුණු මත පදනම්, තිරස-ාර සාමයක් සඳහා කාන්තාවන්ගේ රැකවරණය වඩා වර්ධනය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත්කොට තිබේ.

අප විසින් කාන්තාවන්ගේ රැකවරණය තහවුරු කළ යුත්තේ ඇයි?

ඉහත උදෘතයෙන් පිළිබිඹු වන්නේ යුද්ධයේ දී ඇති වූ පීඩාකාරී තත්ත්වයන් සමනය කිරීම සඳහා අවශ්‍ය මනෝ-සමාජයීය සහය හිමි නොවීම සහ පශ්චාත් යුද වාතාවරණයක් පවතින ශ්‍රී ලංකාවේ එවැනි කාන්තා-වන්ගේ පවුල් සඳහා නිසි සහය සහ ආධාර නොලැබීම නිසා එම කාන්තාවන් කෙරෙහි උද්ගතව පවතින අනාරක්ෂිත තත්ත්වයයි. කාන්තාවන්ගේ රැකවරණය තහවුරු කිරීම තිරසාර සාමයක් උදාකරගැනීම උදෙසා අත්‍යාවශ්‍ය වේ. පොදු ජාත්‍යන්තර නීතිය යටතේ හෝ මානව හිමිකම් සම්මුති යටතේ හෝ ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාව යටතේ, සමාජයක කාන්තාවන්ට අනාරක්ෂිත වාතාවරණයක් පැවතීම ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස භුක්ති විඳීමට ඇති අවස්ථාව ඇහිරීමට සමත් කාරණයකි.

කාන්තාවන්ගේ අනාරක්ෂිතභාවය ඇතිවීමට බලපාන හේතු අතර: අසාධාරණ බෙදීම් ඇතිකරනසුලු සංස-්කෘතික හා සමාජ සම්මතයන්, නීති හා ප්‍රතිපත්ති ස්ත්‍රී පුරුෂ ස කාන්තාවන්ගේ අනාරක්ෂිතභාවය හා ඔවුනට එරෙහිව ක්‍රියාත්මක වන ප්‍රචණ්ඩත්වය යන කාරණා පිළිබඳ නිසි පියවර ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාවට තවමත් හැකියාව ලැබී නොමැත.

යුද්ධයෙන් පීඩාවට පත් විවිධ වර්ගවල කාන්තාවන්ගේ අනාරක්ෂිතභාවය

ගෘහ මූලික කාන්තාවන්

ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද සමයට අදාළව දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ, ගෘහ මූලික කාන්තාවන්ෙ-ග් වැඩිවීමකි. 2012 ජන හා සංඛ්‍යා ලේඛන දෙප-ාර්තමේන්තුවේ දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ මිලියන 1.2 (23%)ක ගෘහ මූලිකයන් ප්‍රමාණයක් කාන්තාවන් ය.

දුගී බව සහ ආරක්ෂාවේ අඩුකම යන කාරණා අති-න් අවදානමට ලක් වූ පිරිසක් ලෙස මෙම ගෘහ මූලික කාන්තාවන් ජාත්‍යන්තර වශයෙන් සැලකිල්ලට ගැනේ. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ ගෘහ මූලික කාන්තාව-ක් විසින් තම අනාරක්ෂිතභාවය පිළිබඳ සිදුකල ප්‍රකාශ-යකි.

ගෘහමූලික කාන්තාවන්ගෙන් බහුවිධ වගකීම් සාමා-න්‍යයෙන් අපේක්ෂා කෙරේ.ගෘහමූලික කාන්තාවන්ගේ දුගීබව හා අසරණභාවයට හේතු ලෙස සමාජය විසින් ස්ත්‍රී පුරුෂ සමානතාවය පිළිබඳ දරන මත හා වෙනත් එවැන්නන් පිළිබඳ පවතින සමාජ දුර්මත සැලකිල්ලට ගත හැක. මෙ-වැනි ගෘහමූලික කාන්තාවන් ඉතා



අපේක්ෂා භංගත්වයට පත්වීමට හේතුවක් වන්නේ සමාජය විසින් පීඩිත වැන්දඹු කාන්තාවන් කෙරෙහි එල්ල කරනු ලබන වැරදි දෘෂ්ටිය කෝණයයි.

එමඟින් වැන්දඹු කාන්තාවන් නිතරම හීනමානයකින් පෙළෙමින් ජීවත් විය යුතු බව ඔවුන්ගේ     වැ-ටහීමයි. පහත දැක්වෙන උදාහරණ මඟින් අනාවරණය වෙන්නේ ගෘහමූලික කාන්තාවන් විසින් මුහුණ දෙනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජ සම්මතය මත පදනම් වූ සමාජ දුර්මත සමහරක් ය. මින් අවසන් උදාහරණයේ දැක්වෙන පරිදි ගෘහමූලික කාන්තාවන් හට සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කළ යුතු ය.  එය සිදුකල යුත්තේ සමාජ ආරක්ෂාව සහතික වන පරිදි සමාජයේ පවතින දුර්මත හා අයදුම් අපකීව මෙන් ම ජීවනෝපායන් සඳහා ද, දරුවන් රැකබලා ගැනීම සඳහා ද, සහාය ලබාදීමට කටයුතු යෙදීමෙනි.

අනාරක්ෂිත බව තුළින් තර්ජනයට ලක්වන මානව අයිතිවාසිකම් අතරඃ ජීවත්වීමට අයිතිය, වද බන්-ධනයට, හිංසාවට, කෲර අමානුෂික ආකාරයේ සැලකිලිවලට හෝ දඬුවම්වලට භාජනය වීම පුද්ගලයෙකු ලෙස නිදහස් හා ආරක්ෂා වීමට ඇති අයිතිය, නීතිය යටතේ සම ආරක්ෂාවක් ලබාදීමේ අයිතිය,

පවුල තුළ සම හිමිකම් ලැබීමේ අයිතිය, ශාරීරික හා මානසික සෞඛ්‍ය තුළින් ඉහළම තත්ත්වයක් පවත්වාගෙන යාමට ඇති අයිතිය සහ රැකියා නියුක්තියේ දී සාධාරණ හා සේවයට හිතකර කොන්දේසි හා නීති යටතේ සේවය කිරීමට ඇති අයිතිය සැලකිල්ලට ගත යුතු ය.

කාන්තාවන් විසින් ප්‍රචණ්ඩ ක්‍රියා හා තම ආරක්ෂාවට තර්ජනයක් වන ආකාරයේ පැමිණිලි ලබාගැනීමට හා ඒ පිළිබඳ ක්‍රියාත්මකවීමට රජය විසින් නිසි සම්බන්ධීකරණයක් සහිත යාන්ත්‍රණයක් සකස්කොට නොතිබීම නිසාවෙන් අගතියට පත් වූ කාන්තාවන් තම එවන් පැමිණිලි පිළිබඳව ක්‍රියාත්මක වන විවිධ සේවා සපයන ආයතන වෙත ------- කිහිපවරක් පැමිණිලි ඉදිරිපත් කිරීමට සිදුවීම හා එවැනි අවස්ථාවල ඒ පිළිබඳ තම අවධානය යොමු නොකිරීම මෙන් ම ඒවා කෙරෙහි වැඩි සැලකිල්ලක් නොදැක්වීම වැනි දෑ සිදුවේ.  (ආසියානු සංවර්ධන බැංකුව, ඩම් බැංකුව සහ ඨගෂග' ආයතනය 1015).

ජන හා සංඛ්‍යා ලේඛක/ලේඛන දෙපාර්තමේන්තුව (2012 ගෘහමූලික භාවය, විවාහක හෝ අවිවාහක බව, ලිංගිකත්වය හා ක්ෂේත්‍රය....

ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ සමාජ මතයට අනුව, මිල මුදල් ඉපයීම හා පවුලට ආරක්ෂාව සැපයිය යුත්තේ පුරුෂයා විසින් ය.

අතරුදහන් වූ පුද්ගලයින්ගේ බිරින්දෑවරු හා මවුවරු තම සමීපතමයන්ගේ අතුරුදහන් වීමෙන් ඇති වූ මානසික පීඩාවෙන් බොහෝ කාන්තාවන් නිහඬව එම පීඩාවන් දරා සිටින බව දැක්විය හැක.  අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ සොයා බැලීම සඳහා වසර තුනක කාලයක් ඉලක්කකොට ජනාධිපති කොමිසමක් පත් කරනු ලැබුව ද මෙම කොමිසම මඟින් ලැබුණු විසඳුම් පිළිබඳව බොහෝදෙනා පසුවන්නේ නොසතුටිනි.

මෙම කොමිසම වෙත අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ සිදුවීම් 23586 ක් වාර්තා වුව ද, 1990 ජුනි 10 වන දින සිට වර්ෂ 6.2009 මැයි මස 19 වන දින දක්වා සිදුවීම් 6500 පිළිබඳ පමණක් මෙම කොමිසමේ අවධානයට ලක් වී ඇති අතර, මෙම කොමිසම පිළිබඳ ඉදිරිපත් වී ඇති ගැටලු තුළ විනි-විදභාවයක් නොමැති වීම හේතුවෙන් විමර්ෂන හෝ අන්තර්කාලීන වාර්තා පිළිබඳ තොරතුරු ජනතාවට හෙළි නොවීම දැක්විය හැක.  පහත උපුටා

දක්වා ඇත්තේ ක්‍රමානුකූලව 7. අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ සත්‍ය හෙළිකිරීමේ ක්‍රියාවලියට අදාළව කාන්තාවන් විසින් සිදුකල ප්‍රකාශ සමහරකි. අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් යළි එකතු කිරීම ඊට අදාළ සමහර පැමිණිලි විභාග කිරීම අවසන් කිරීම එවැනි පුද්ගලයන් වෙනුවෙන් වන්දි ගෙවීම සහ සෙසු 8. සහන ලබාදීමේ අරමුණින් අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ කාර්යාලයක් ගරු අගමැතිතුමා විසින් කැබිනට් මණ්ඩලය සඳහා ඉදිරිපත් කළ පාර්ලිමේන්තු පනතක් මගින් 2016 අගෝස්තු මාසයේ ස්ථාපිත කෙරිණි. 9. මෙම පනතට අනුව ඒ සඳහා ක්‍රියාකාරි සාමාජිකයන් පත්කිරීම සිදුවන්නේ ව්‍යවස්ථාදායක මණ්ඩලය නිර්දේශවලට අනුව ජනාධිපතිවරයා විසිනි. 10. මෙම කාර්යාලය සමන්විත වන්නේ ලේකම් කාර්යාලයකින් 11. විමර්ශන ඒකකයකින් හා වින්දිතයන් මෙන් ම සාක්ෂිකරුවන් සඳහා ආරක්ෂාව සපයන අංශයකින් ය.

යුධ සෙබළියන් ලෙස කටයුතු කළ කාන්තාවන්

යුධ සෙබළියන් ලෙස කටයුතු කළ කාන්තාවන් ආරක්ෂාව පිළිබඳ ගැටලු තවමත් පවතින අතර, ඊට හේතු ඔවුන්ගේ ප්‍රජාව තුළ පවතින විරෝධාකල්ප හා රජය විසින් ඒ පිළිබඳව දරන ස්ථාවරය සාධාරණිය එකක් නොවීම යන කාරණා වේ. පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල් කාර්යාලය පවසන පරිදි එවැනි කාන්තාවන් 2032 දෙනෙක් පුනරුත්ථාපන කිරීමට හැකි වී තිබේ. රජය දරන මතය වන්නේ මෙවැනි කාන්තාවන් වැරදි වැටහීම් නිසාවෙන් තම අතීත ජීවිතය නිකරුණේ නාස්තියට ලක්කොට ඇති පිරිසක් ලෙසය.

2016යේ අංක 32 වන අතුරුදහන් වූ පුද්ගලයින්ගේ කාර්යාල පනතේ අනු අංක අනුව, අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය අතුරුදහන් වූ පුද්ගලයන් සොයාගැනීමට හා ගවේෂණයට ඒ සඳහා යෝග්‍ය යාන්ත්‍රණයන් හඳුන්වා දී ඇත, අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳ පියවර ගැනීමට බලධාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ ඥාතීන්ගේ, අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ ඥාතීන් සහන ලබාගත හැකි අතර, ඔවුන්ට එම අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධ අදාළ තොරතුරු හා රජයේ ආයතන හා අනෙකුත් ආයතනවල සහ එහි දත්ත සමුදාය තුළින් ලබාගත හැක.

2016 අංක 32 දරන අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳ කාර්යාල පනත,
2016 අංක 32 දරන අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳ කාර්යාල පනත, අ.4
2016 අංක 32 දරන අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳ කාර්යාල පනත අ.16

2016 අංක 32 දරන අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳ කාර්යාල පනත, අ.17
2016 අංක 32 දරන අතුරුදහන් වූ පුද්ගලයින් පිළිබඳ කාර්යාල පනත, අ.18

මෙම කාන්තාවන් අධ්‍යාපනය ලබාගැනීමේ දී, රැකියාවේ දී මෙන්ම විවාහ ජීවිතයේ දී බොහෝ ගැටළුවලට මුහුණපාති. 17 ඔවුන්ට අධ්‍යාපන ආයතනවල වෙනස්කම්

කර ඇති අතර කොටි සංවිධාන සමග ඇසුර නිසා රැකියා සඳහා බඳවා ගෙන නොමැත. රජය හිටපු හමුදා සෙබළුන් පුනරුත්ථාපනය කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වුව ද, මෙම වැඩසටහන අවසන් වූ පසු ඔවුන් හට 18 ආර්ථික බලගැන්වීම සඳහා මනෝ-සමාජීය සහාය හෝ සහයෝගය ලැබෙන්නේ කලාතුරකිනි.

කාන්තාවන්ගේ ආරක්ෂාවට ඇති තර්ජන

කාන්තාවන්ට එරෙහි හිංසනය 19

කාන්තාවනට එරෙහි විවිධ ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් පැවැතීම කාන්තාවන් ආරක්ෂාව සඳහා තර්ජනයකි. ලිංගික ප්‍රචණ්ඩත්වය වැඩ බියවැද්දීම්, පාසල් ප්‍රචණ්ඩත්වය, ළමා විවාහ, නව යොවුන් වියේ ගැබ් ගැනීම් වැනි දෑ ගැන තම අදහස් පළ වී තිබුණත්, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ පුළුල් දත්ත දත්තයන් ලැබී නැති බැවින්, ඒ පිළිබඳව සිදු කරන ව්‍යාපෘති විශාල සහ අපහසු එකක් වේ. නීතියේ, 20 අධිකරණ වෛද්‍ය විශේෂඥ, ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ නඩු කටයුතු 21රෙෆරල් ක්‍රමය යටතේ හසුරවන ආකාරය දුර්වල වේ. ඔවුන් එම සිද්ධි පිළිබඳ ඍණාත්මක බලපෑම් ඇති කරනු ඇතැයි හැඟෙන නිසා බොහෝ කාන්තාවන්, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ නඩු වාර්තා කරන්නේ නැත. ශ්‍රී ලංකාව තුළ කාන්තාවන්ට එරෙහි අනාරක්ෂිත බව හා ප්‍රචණ්ඩත්වය

අමතමින් රාජ්‍ය ආයතන විසින් ප්‍රමාණවත් ප්‍රතිචාරයක් නොලැබෙන බව 'ැසා ෂීා අල් හුසේන් මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් විසින් අවධාරණය කරන ලදී.

පළාත් භාෂාවන්ට රජයේ සේවයේ දී වන අපහසුතා.

ප්‍රාදේශීය භාෂා භාවිතකරන රජයේ සේවාවන් වෙත ප්‍රවේශවීමට නොහැකිවීම බොහෝ සුළු ජන කාන්තාවන්ගේ ආරක්ෂාවට තර්ජනයකි. මෙය ජාතික භාෂා ප්‍රතිපත්තිය අකාර්යක්ෂමව ක්‍රියාත්මකවීමේ ප්‍රතිඵලයකි. ශ්‍රී ලංකාවේ නීතියට අනුව දෙමළ සහ සිංහල යන භාෂා දෙකම ජාතික භාෂා ලෙසත් ඉංග්‍රීසි භාෂාව ඇමුණුම භාෂාවක් ලෙසත් පිළිගැනේ. 22 නිල භාෂා ප්‍රතිපත්තියේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා නිල භාෂා කොමිෂන් සභාවක් ස්ථාපිත කර ඇත. 23 ව්‍යවස්ථාපිත හා පරිපාලන විධිවිධාන නිල භාෂා ප්‍රතිපත්තියක් ක්‍රියාත්මකක කිරීම සඳහා ඉදිරිපත් කර ඇති නමුත්, ශ්‍රී ලංකාවේ කාන්තාවන් තවමත් දේශීය භාෂාවලින් රජයේ සේවාවන් ලබාගැනීම සඳහා තවමත් අරගල කරයි. පහත සඳහන් ප්‍රකාශ නිසා භාෂාව පිළිබඳ ගැටලු කාන්තාවන් අනාරක්ෂිත අනාවරණය කරයි.
ආර්ථික අනාරක්ෂිතභාවය
කාන්තාවන්ගේ ආරක්ෂාව ඔවුන්ගේ ආර්ථික ආරක්ෂාව මත ද රැඳී පවතියි.

සෞඛ්‍ය, අධ්‍යාපනය, වාසස්ථානය, තොරතුරු, මූලික සමාජ ආරක්ෂාව, යටිතල පහසුකම්, මෙන්ම රැකියාව හා සම්බන්ධ ආරක්ෂාව, ආර්ථික ආරක්ෂාව මඟින් අර්ථ දක්වා ඇත. කාන්තාවන්ට තම ආර්ථික ආරක්ෂාව සම්පූර්ණ කරගැනීමේ දී විවිධ ගැටලුවලට මුහුණපාන්නට සිදුවේ. 24 සංඛ්‍යා ලේඛන දත්තයන්ට අනුව ජාතික ශ්‍රම බලකායට කාන්තාවන්ගේ දායකත්වය 34.4% වන අතර, එය ආර්ථිකමය වශයෙන් ක්‍රියාකාරී පිරිමි ප්‍රතිශතයෙන් අඩකි. 25 ආර්ථිකයට කාන්තාවන්ගේ දායකත්වයේ අඩු බව රැකියාවල දී ඔවුන්ට මුහුණදීමට වන පසුබෑම් සනාථ කරයි.26

රැකියා ගැන පැහැදිලි ස්ත්‍රී පුරුෂ විෂමතාවයක් අධ්‍යාපන මට්ටම්වලට සාපේක්ෂව සලකන විට ද පවතී. කාන්තා රැකියා අධ්‍යාපනය සෑම මට්ටමක දී පිරිමින්ට වඩා අඩු ය.
බොහෝ ශ්‍රී ලාංකික කාන්තාවන් ජීවනෝපාය හා ආර්ථික ආරක්ෂාව වැඩිදියුණු කරගැනීම සඳහා අරගලයක් කරයි. ඉහත උදෘතයේ දක්වා ඇති ආකාරයට ජීවනෝපාය ක්‍රම සහ පුහුණුවීම් ලබාදීම මඟින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවිය හැක.

බොහෝ ක්ෂුද්‍ර මූල්‍ය හා ණය සමාගම් විසින් ආකර්ෂනීය පොලී හා ගෙවීම් යෝජනා ක්‍රම මඟින් කාන්තාවන් සූරාකති. මෙය බොහෝ විට සිදුවන්නේ අලෙවි නියෝජිතයන්ට ඉලක්කවීම නිසාවෙන් ඒවා ඉටු කරගැනීමට ඔවුන් උත්සුක වීම නිසයි. මෙම ණය ගෙවා ගැනීමට කාන්තාවන් ගමන් සතු සියලු දෑ උකස් තියන අවස්ථා ද, පිරිමින් නිවෙස්වලින් පලායන අවස්ථා ද, සිය දිවි හානි කරගැනීම් ද සිදුවේ. රජය විසින් මෙම ක්ෂුද්‍ර මූල්‍ය හා ණය සමාගම්වලට ආචාර්ය ධර්ම පද්ධතියක් හඳුන්වා දිය යුතු අතර, එය නිරීක්ෂණය කිරීමට නිසි යාන්ත්‍රණයක් ද ස්ථාපිත කල යුතුයි.

කාන්තා හඬ දේශපාලන වේදිකාවට ඇසෙන්නේ නැත. කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය වැඩි කිරීමෙන් ඔවුන්ගේ අදහස් තීන්දු තීරණවල දී ඔවුන්ගේ අදහස් විමසීම කාන්තාවන්ගේ හඬට සවන්දීමට ඇති එක විදියකි. 28 දේශපාලනයේ කාන්තා නියෝජනය වැඩිකිරීම මඟින් සමාජයේ දී කාන්තාවන්ගේ ආරක්ෂා-









ාව වැඩි කළ හැකියි. දේශපාලනයේ කාන්තා නියෝජනයේ අඩු බවට හේතුව සම්ප්‍රදායික ජන සමාජයේ බලපෑමයි.

කාන්තාවන්ගේ ආරක්ෂාව ආරක්ෂා කරගැනීමේ යාන්ත්‍රණය

තිරසාර සංවර්ධන ඉලක්ක හා ආරක්ෂක මණ්ඩලයේ යෝජනාවේ 1325, 1820, 1888, 1889 දී, කාන්තා ආරක්ෂාව තහවුරු කිරීමේ අවශ්‍යතාව, ජාත්‍යන්තර පිළිගැනීමට ලක්ව ඇත. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ඇතුළු කාන්තාවන් අනාරක්ෂිත බව දුරලීම පිළිබඳ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තිය හඳුන්වා දී තිබේ.

කාන්තා ආරක්ෂාව තර කිරීමට අනාගත සැලසුම්

- ස්ත්‍රී පුරුෂ භාවය මත ප්‍රචණ්ඩ ක්‍රියාවලට එරෙහිව ජාතික කෙටුම්පතක් නිර්මාණය කිරීම.
- යුද්ධයේ බලපෑමට ලක් වූ ගෘහමූලික කාන්තාවන් වෙනුවෙන් කෙටුම්පතක් නිර්මාණය කිරීම.
- එක්සත් ජාතීන්ගේ උදව් ඇතිව සාමය ගොඩනැගීමේ අරමුදලක් පිහිටුවීම.
- කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය ස්ත්‍රී පුරුෂ ප්‍රතිචාරාත්මක රාජ්‍ය පාලනය වැඩිදියුණු කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශයේ කේන්ද්‍රීය ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇත.

කාන්තාවන් සඳහා ශ්‍රී ලංකා ආරක්ෂිත හා සමාකාමී පෙදෙස ගත කරමු.

- කාන්තාවන්, වැන්දඹුවන් කෙරෙහි සමාජයේ ඇති වැරදි ආකල්ප හා දුර්මත නිවැරදි කිරීම.
- මියගිය සැමියාගේ උරුමයන්ට ප්‍රවේශය ලබාදීම.
- යුද්ධයෙන් බලපෑමට ලක් වූ කාන්තාවන්ට සහය ලබා දීම.
- යුද්ධයෙන් බලපෑමට ලක් වූ කාන්තාවන්ට හා වැන්දඹුවන්ට තම දරුවන්ට අධ්‍යාපනය ලබා දීමට ප්‍රවේශයක් සැපයීම.
- ප්‍රාදේශීය භාෂා යොදා ගනිමින් රාජ්‍ය සේවා ලබාගැනීමට හැකි ක්‍රමවේදයක් සැකසීම.
- කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ නිසි තොරතුරු රැස් කිරීමට සුදුසු යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
- ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ වෙනස්කම් පිළිබඳ පැමිණිලි විභාග කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.
- දුෂ්කර ප්‍රදේශවල කාන්තාවන්ට නොමිලේ මානසික සහ සමාජීය සහය සැපයීමට මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
- කාන්තාවන් මූල්‍ය ආරක්ෂක සුරක්ෂිත කිරීමට විස්තීර්ණ ජීවනෝපාය හා ආදායම උත්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීම.
- ක්ෂුද්‍ර මූල්‍ය හා ණය සමාගම්වලට රජය විසින් ආචාරය ධර්ම පද්ධතියක් හඳුන්වා දීම.

සාරාංශය

පශ්චාත් ගැටුම් පැවති කාලය තුළ ශ්‍රී ලංකා රජය විසින් හිටපු කාන්තා සටන්කරුවන්, අවතැන් ස්ත්‍රීන් ද ඇතුළු යුද්ධය නිසා පීඩාවට

පත් පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීමට වැඩසටහන් ආරම්භ කර ඇත. රජය විසින් අතුරුදහන් වූ පුද්ගලයන් පවුල් සඳහා සහයෝගය දැක්වීම ආරම්භ කර ඇත. එහෙත්, කාන්තාවන්ගේ ආරක්ෂාව තවමත් පවතින්නේ අවදානම් මට්ටමකයි. එය සලකා සහ

ප්‍රචණ්ඩාත්වයෙන් ආරක්ෂාව, ආර්ථික ආරක්ෂාව, සේවාවලට ආරක්ෂිත ප්‍රවේශය සහ දේශපාලන වේදිකාව වෙත ප්‍රවේශය ඇතුළු කාන්තාවන්ගේ විවිධ ආරක්ෂක අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය වේ. කාන්තාවන්ගේ ආරක්ෂක ගැටලු පිළිබඳ ක්‍රියාත්මකවීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් රජය විසින් ලිංගිකත්වය පදනම් වූ ප්‍රචණ්ඩත්වය, කාන්තාව මූලික වූ පවුල් හා ස්ත්‍රී පුරුෂ ප්‍රතිචාර මත පදනම් වූ අයවැය සම්බන්ධයෙන් අවධානය යොමුකර සැලසුම් යෝජනා කර තිබේ. මෙම යෝජනාවන් සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීම සිදු විය යුතුයි.

References

Asian Development Bank, Deutsche and Gesellschaft für Internationale Zusammenarbeit (GIZ) GmbH (2015) Country Gender Assessment, Sri Lanka – An Update. https://www.adb.org/sites/default/files/institutional-document/172710/sri-lanka-country-gender-assessment-update.pdf (Last retrieved 2 November 2016)

Coomaraswamy, R. (2015) Summary of the Consultation with war affected women for the Global Study on 1325 – A 15 Year Review.

Bureau of the Commissioner General of Rehabilitation (2011) Rehabilitation of Adult Ex-Combatants. http://www.bcgr.gov.lk/adult-intro.php(Last retrieved 4 November 2016)

Department of Census and Statistics (2012) Census of Housing and Popula-tion.http://www.statistics.gov.lk/pophousat/cph2011/pages/activities/reports/cph_2012_5per_rpt.pdf(Last retrieved 3 November 2016)

Fernando P. and Ariyaratne T. (2013) Role of Women in the Economy: There's more to empowering Sri Lankan women than meets the eye. LMD. http://www.cepa.lk/index.php?option=com_publications&view=publication&id=162(Last retrieved 5 November 2016)

ILO (2004) Economic Security for a Better World. ILO: Programme on Socio-Economic Security.

UNFPA (2016) Gender and Development in Sri Lanka: Implications for Policy and Action. Thematic Report based on Census of Population and Housing 2012.

UNFPA (2016) A Programme Proposal for the Government of Sri Lanka by UNFPA as the Chair of the Gender Theme Group of the United Nations, Sri Lanka. The National Initiative for Empowering Women Headed Households.

UN Office of the High Commissioner for Human Rights (2016) Statement by UN High Commissioner for Hu-man Rights ZeidRa'ad Al Hussein at the

end of his mission to Sri Lanka, 9 February 2016. http://www.ohchr.org/EN/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=17025&LangID=E(Last re-trieved 2 November 2016)

International Legal Instruments

The UN Declaration on the Elimination of Violence against Women, 1993.
Beijing Platform for Action, 1995.
Security Council Resolution 1325 of 2000.
Security Council Resolution 1820 of 2008.
Security Council Resolution 1888 of 2009.
Security Council Resolution 1889 of 2009.
UN Sustainable Development Goals, 2015.

National Legal Instruments

Constitution of Democratic Socialist Republic of Sri Lanka, 1978.
Official languages Act No. 18 of 1991.
Sri Lanka Women's Charter, 1993.
Prevention of Domestic Violence Act, No 34 of 2005.
Penal Code (Amendment) Act, No 16 of 2006.
Protection of Victims of Crime and Witnesses Act, No 4 of 2015.
Local Government Authorities (amendment) Act of 2016.
Office on Missing Persons Act No 32 of 2016.

Briefing Paper No- 1, December 2016
Published by: National Peace Council- 12/14 Purana Vihara road, Colombo 6,
Sri Lanka.
Tel:+94 112 818 344, 0112 854 127 Fax: +94 112 819 064 Web: www.peace-srilanka.org

All rights reserved. Material from this publication maybe used with due credit to the National Peace Council.
Thanking Miss Nirekha De Silva for drafting the Briefing Paper.

Supported by

FOKUS

FORUM FOR WOMEN AND DEVELOPMENT